## තනතුරු පුරප්පාඩු
## කෘෂිකර්ම සහ වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය
## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් කාර්යාල (තනතුරු 06)

**තනතුරට පැවරෙන කාර්යයන්**

මණ්ඩලයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත, ගොවි විශ්‍රාම වැටුප් පනත හා ධීවර විශ්‍රාම වැටුප් පනතට අදාළ වගා රක්ෂණ, සමාජ ආරක්ෂණ, සෞඛ්‍ය රක්ෂණ, කෘෂිකාර්මික ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්‍රම ක්ෂෙත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම, ඒ සඳහා සැලසුම් කිරීම,අලෙවි විභවතාවන්ට ගැලපෙන පරිදි ඉලක්කගත කර ඉහළ කාර්ය සඵලතාවක් ඇති වන ආකාරයට ක්ෂෙත්‍ර කාර්ය මණ්ඩලය මෙහෙයවීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම. අදාළ රාජකාරි පිළිබඳව අධ්‍යක්ෂ (මෙහෙයුම්) වෙත වගකීම හා කළමනාකාරිත්වයට වගකීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**i. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/කළමනාකරණය/රක්ෂණය/අලෙවිකරණය/වාණිජ්‍යය/ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂෙත්‍රයකින් ලබාගත් උපාධියක් හා උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක ක්ෂෙත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද.

**ii. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

**සුදුසුකම්**

මණ්ඩලයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක ක්ෂෙත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

හෝ

ඉහත (i) හි සඳහන් උපාධි ක්ෂෙත්‍රය හැර ඕනෑම උපාධියක් සහිතව මණ්ඩලයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අනිවාර්ය සුදුසුකම්**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MM 1-1 රු. 53,175 – 10 x 1375 – 15 x 1910 –95,575/- (MM 1-1 2016) වේ. (මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**වයස් සීමාව :**

වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**අතිරේක සුදුසුකම් :**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
ii. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

**වෙනත්:**

සෑම අපේක්ෂකයෙක්ම,

(අ). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ). තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ). විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගන්නා ආකාරය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**සේවා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. සේවා දායකයා විසින් වැටුපින් 10% ක් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් 15% යන පදනම යටතේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත. මණ්ඩලය මඟින් වැටුපින් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද දායකත්වය සලසනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු අතර, ඔවුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. තවද අපේක්ෂකයා තෝරා ගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදාහැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :**

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ ඥාතීන් නොවන තොරතුරු දැන ගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ද සහිතව 2024.05.20 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතික වල පිටපත් අමුණා නැති හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය. බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,**
**අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ.**
**2024.04.30**